පුස්තකාල ප්‍රවෘත්ති

நூலகச் செய்திகள் LIBRARY NEWS

11 වන කලාපය 1–2

1990 ජනවාරි – ජූනි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

30/-
7/50

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
විවෘත කිරීමේ උළෙල
1990.04.27
ශ්‍රී லங்கா தேசிய நூலகத் திறப்பு விழா
INAUGURATION OF THE NATIONAL LIBRARY OF SRI LANKA

පුස්තකාල ප්‍රවෘත්ති

நூலகம் செய்தி

LIBRARY NEWS

1990 ජනවාරි/ජූනි

11 වන කලාපය 1/2

සංස්කරණ උපදේශක මණ්ඩලය

ඊශ්වරී කොරයා
සභාපතිනී

එම්. එස්. යූ. අමරසිරි
වැඩ බලන අධ්‍යක්ෂ

නාලිනී ද සිල්වා
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ

එච්. එම්. ගුණරත්න බණ්ඩා
වැඩ බලන සහකාර අධ්‍යක්ෂ

ජානකී ප්‍රනාන්දු
වැඩ බලන සහකාර අධ්‍යක්ෂ

ප්‍රධාන සංස්කාරක
එම්. ඒ. මිල්ටන්

කාර්යාල කටයුතු හා සෝදුපත් කියවීම
යුරිකා පද්මිණී මුණසිංහ

පිට කවරය හා පිටු සැලසුම්
උපුල් නුවන් ජයරත්න

කැමරා ශිල්පී
හේමන්ත අරුණසිරි

මුද්‍රණය
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

පටුන

	පිටුව
සංස්කාරක සටහන	2
ශ්‍රීමත් ජනාධිපති උතුමාණන් පවත්වනු ලැබූ කථාව	3 – 5
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා පවත්වනු ලැබූ කථාව	6 – 7
අධ්‍යාපන සේවා අමාත්‍යතුමිය පවත්වනු ලැබූ කථාව	8
උත්සවයේ විවිධ අවස්ථා කැමරා ඇසින් ...	9 – 12
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිතුමිය පවත්වනු ලැබූ කථාව ...	13 – 14
ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබා ගැනීම	15
පුවත් ලුහුඬින්	16 – 18

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

ජාතික පුස්තකාලය
වචනය වූ වගයි

1970 අංක 17 දරණ ශ්‍රී ලංකා ජාතික
පුස්තකාල සේවා මණ්ඩල පනතේ ප්‍රධානතම
අරමුණ වූයේ ජාතික පුස්තකාලය පිහිටුවීම යි

පන්නින් දශක දෙකක් ඉක්ම ගොස් හෝ
එහි ප්‍රධාන අරමුණ පයගෙන් මේ මහාහොඳ ජාතික
පුස්තකාලයක ඒ‍වගෙයාව පිළිබඳ අපේක්ෂාවන්
හාඬා සිටි ලාංකීය ජනතාවට වැදගෙන් වේ

ගොවිගියේ වසි වසර ජාතික පුස්තකාලය
පිහිටුවීමේ අණයෝගයට අපි මුහුණ පාන්නෙමු
අද එය පයගෙන ඇත හොඳ දනයේ අප
මුහුණාදිය යුත්තේ ජාතික පුස්තකාලය ඒ‍වගෙන
යාමේ අණයෝගයටයි එය ජාතික පුස්තකාලය
පිහිටුවීම තරම් පුබල අණයෝගයක් නොවනු ඇත

ජාතික පුස්තකාලයේ වචනය වීමත් සමගම
"පුස්තකාල ඒ‍වාත්" නිව ඇදුකින් පාඨකයන්
අතට පත් කරීමට තීරණය වීම අප කාගේත්
සතුටට හේතු වේ එහි පළමු පියවර ලෙස
මෙවර කලාපය ජාතික පුස්තකාලය
විවෘත කිරීමේ උළෙල වෙනුවෙන්
වෙන් කරන්නට සේදුනි

සංස්කාරක

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයේ දී ශ්‍රීමත් ජනාධිපති ආර්. ප්‍රේමදාස උතුමාණන් පවත්වනු ලැබූ කථාව

ගරු කටයුතු නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ඇතුළු මහා සංඝ රත්නයෙන් අවසරයි,
ගරු කටයුතු රාජගුරු පූජ්‍ය ප්‍රඥාදීන් වහන්සේගෙන් අවසරයි,
මැති ඇමැතිවරුනි, නානාපතිවරුනි, සහෝදරවරුනි,

පුස්තකාල ඉතිහාසයට අද මේ නව ගොඩනැගිල්ල ඇතුළත් වෙනවා. රුපියල් ලක්ෂ පන්සිය පණස් පහක්, පන්සිය පණහක් පමණ මේ ගොඩනැගිල්ල සඳහා වියදම් වී තිබෙන බව අධ්‍යාපන සේවා කටයුතු පිළිබඳ ඇමැතිනිය මට කිව්වා. විශාල මුදලක්. ඒ මුදල සාධාරණ වියදමක් කියල අපිට හිතන්නට පුළුවන්, මේ ගොඩනැගිල්ල දිහා බලන කොට. දැන් මේ ගොඩනැගිල්ල හදල ඉවර කරන්න හුහාක් ප්‍රමාද වුණා. මං හිතන්නේ දැන් මිට අවුරුදු පහකට විතර කලින් මේ ගොඩනැගිල්ලේ කටයුතු අවසාන වෙන්ට තිබුණෙ. මේ ගොඩනැගිල්ල ඉදි කිරීමේ දී ඇති වෙච්ච යම් යම් ප්‍රශ්න නිසා මෙතෙක් ප්‍රමාද වුණෙ. ලලින් ඇතුලත්මුදලි ඇමතිතුමා කිව්වා වාගේ මේ ජාතික පුස්තකාල වැඩ පිළිවෙලට මුල පිරුවේ 1970 මාර්තු මාසේ දිවංගත අධ්‍යාපන අමාත්‍ය අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මැතිතුමාගේ මූලිකත්වයෙන්. එතුමාගේ පුරෝගාමීත්වයෙන්. ඒ වුණාට මේ පුස්තකාල සේවාවට දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. එක්දහස් අටසිය ගණන්වලට තරම් ඇතට යන ඉතිහාසයක් මේ ජාතික පුස්තකාල වැඩ පිළිවෙලට තිබෙනවා. නමුත් මෙය ජාතික වශයෙන් විශේෂ පුස්තකාලයක් හැටියට මහා පරිමාණයේ පුස්තකාලයක් හැටියට සකස් වෙන්ට පටන් ගත්තේ ඊට පස්සේ. දැන් මේ පුස්තකාලය ගැන කල්පනා කරන කොට ලෝකයේ නොයෙක් රටවල්වල මේ විදියේ ජාතික පුස්තකාල තිබෙනවා. අපි මෙවැනි ජාතික පුස්තකාල හඳුන්වන්නේ ජාතියේ, රටේ ඉතිහාසය, රටේ සංස්කෘතිය පිළිබඳ පෙරළිය විදහා පාන කැඩපතක් හැටියට. එවැනි පුස්තකාලයක් හැම රටකටම අවශ්‍යයි. දැන් මේ ගොඩනැගිල්ල නිසා ඒ කාර්‍යය හොඳින් ඉෂ්ට කරන්නට පුළුවන්කම ලැබෙනවා. දැනට මේ කාර්‍ය භාරය පැවරී තිබෙන්නේ ලංකාවේ අද සිටින පුස්තකාල සේවාව පිළිබඳ පරිණත දැනුමක් ඇති පළපුරුද්දක් ඇති, පුස්තකාලයාධිපතිනියක් අතේ. ඊශ්වරී කොරයා මැනිණිය මෙවැනි වැඩ පිළිවෙලකට ඉතාම උසස් සුදුසුකම් ඇති කෙනෙක් බව අපි කවුරුත් දන්නවා. එතුමිය දීර්ඝ කාලයක් කොළඹ නගර සභාවේ පුස්තකාලය භාරව ක්‍රියා කළා. එ වගේම එතුමිය පුස්තකාල කටයුතු පිළිබඳ විශේෂඥ දැනුම් ඇති අය සමග මෙහි සේවයේ යෙදී සිටිනවා. එ නිසා අපි සතුටු වෙනවා එතුමියගේ සේවය මේ ජාතික පුස්තකාල සේවාවට ලබා ගන්නට පුළුවන් වීම ගැන.

යුනෙස්කෝ ආයතනය, අපට හුහක් උදව් කළා විශේෂයෙන්ම මේ පුස්තකාලයේ සැලැස්ම සකස් කර ගැනීමට. ඒ ගැන අපේ කෘතඥතාවය අපි පිරිනමන්ට ඕනේ. දැන් මේ පුස්තකාලයට පැවරෙන විශාල වගකීමක්, අපේ රටේ පල කෙරෙන පොත පත පමණක් නොමෙයි හැම ලියවිල්ලක්ම සුරක්ෂිත කිරීම, ඒවා ආරක්ෂා කර නැබීම, ඒ පිළිබඳ පර්‍යේෂණ පැවැත්වීම, ඒවා පිළිබඳ නිසි තොරතුරු ගොනු කර නැබීම, මෙවැනි ජාතික පුස්තකාලයක ප්‍රධාන යුතුකමක් බව නමුන්නාන්සේලා පිළිගන්නවා ඇති. රට පුරාම තිබෙන පුස්තකාල පද්ධතියට මේ පුස්තකාලයේ නායකත්වය ලැබෙන්ට ඕනේ. මේ පුස්තකාලයෙන් ආභාෂය ලැබෙන්ට ඕනෙ. ආදර්ශය ලැබෙන්ට ඕනෙ. එහෙම කල්පනා කරන කොටයි මෙවැනි පුස්තකාලයක ඇති වටිනාකම අපට කල්පනා කරන්නට පුළුවන් වෙන්නෙ, අපිට ජාතික වශයෙන්. ජාත්‍යන්තර වශයෙන් ලෝකයේ පළ වෙන ලිය කියවිලි, පොත පත පිළිබඳව සැහෙන ප්‍රමාණයකට මේ ජාතික පුස්තකාලය තුළ සැකසීමක් තිබෙන්නට ඕනේ. ඒ වගේම තැන්පත් කිරීමක් තිබෙන්නට ඕනේ. අදාළ විෂයයන් පිළිබඳව ගවේෂණය කෙරෙන්නට ඕනේ. එහෙම කල්පනා කරන කොට අපේ බුද්ධිමතුන් රාශියකගේ දැනුම, අත්දැකීම් මේ ජාතික පුස්තකාල සේවාවේ පෝෂණයට අවශ්‍ය වෙනවා.

මට පේනවා අද මේ ස්ථානයේ අපේ විද්වතුන් රාශියක් සිටිනවා. බුද්ධිමතුන් රාශියක් සිටිනවා. මම ආරාධනා කරන්නට නැමැතියි ඒ හැම දෙනාටම නමුන්නාන්සේලාගේ ඒ අත් දැකීම්, දැන උගත්කම්, ඒ අවබෝධය මේ ජාතික පුස්තකාලය පෝෂණය කිරීමට අපට ලැබෙන්නට ඕනේ. නමුන්නාන්සේලා සමහර දෙනෙක් විශ්ව විද්‍යාල වැනි අපේ උසස් ආයතනවල සේවය කරලා විශ්‍රාම ලැබූ අය. නොයෙක් විෂයයන් සම්බන්ධයෙන් දැනුම් තේරුම් ඇතිව ඒ ඒ කාර්‍යයන් කරලා විවේකව සිටින අය. එහෙම උදවියගේ සේවාව අපි ලබා ගන්නට ඕනේ. මේ ආයතනයේ විවිධ විෂයයන් පිළිබඳව කරුණු එක් රැස් කර ගන්නා ස්ථානයක්. ඇත්ත වශයෙන්ම ජාතික ලේඛනාගාරය අපිට එක අතකින් උසස් සේවයක් ඉටු කරනවා. අනිත් අතින් ජාතික පුස්තකාලය තවත් විධියකින් එවැනිම සේවයක් ඉෂ්ට කරනවා. මේ ආයතන දෙකම බොහොම කිට්ටුව තිබෙන්නෙ. ඒකත් මේ වැඩ පිළිවෙලට ඉතාම ප්‍රයෝජනවත්. ඒ වගේම අපට ජාත්‍යන්තර වශයෙන් හුවමාරුවක් ඇති කර ගන්නටත් තිබෙනවා. නොයෙක් රටවල්වල පුස්තකාල සේවාවේ විශේෂඥයන් මෙහාට ගෙන්න ගන්නා. ඔවුන්ගේ උපදෙස් ලබා ගන්න. දැනට මා සන්තෝෂයි කියන්නට, රටවල් ගණනාවකින් අපිට ඒ අතින් උදව් ලැබෙනවා. මේ හුවමාරුව දැනට සිදු වේගෙන

යනවා, අපේ මිත්‍ර රටවල් අතර. දැනටම ඕස්ට්‍රේලියාව, ඒ වගේම ජපානය, සිංගප්පූරුව, මැලේසියාව, ඒ වගේම සෝවියට් දේශය, ඉන්දියාව, මහා බ්‍රිතාන්‍යය මේ රටවල් සමග දැන් විශේෂ හුවමාරුවක් ඇති වෙනවා. බොහොම සන්තෝෂයි අපේ ඒ මිත්‍ර රටවල්වල තානාපතිතුමන්ලා, තානාපතිනියන් – ඕස්ට්‍රේලියාවේ, මේ ස්ථානයේ සිටීම ගැන. මොකද, ඒ රටවල් මේ අතින් විශේෂ දියුණුවක් ලබල තිබෙනවා – මේ පුස්තකාල සේවාවේ.

ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාත්, සුනේත්‍රා රණසිංහ ඇමැතිනියත් තමුන්නාන්සේලාට විස්තර කළා මේ පුස්තකාලයක තිබෙන වටිනාකම ගැන, අවශ්‍යතාවය ගැන. එයින් ලැබිය හැකි පල ප්‍රයෝජනය ගැන. ඇතුලත්මුදලි ඇමතිතුමාගේ කතාව අවසාන කළේ ගාන්ධි තුමාගේ ප්‍රකාශයෙන්. **අපි අපේ නිවස ඒ රට හැටියට සලකනවා නම්, ඒ අපේ රටේ හැම දොරටුවක්ම, කවුළුවක්ම අපි විවෘත කොට තබන්ට ඕනේ, ලෝකයේ හැම අතින්ම හමා යන සුළඟට අපේ නිවස හරහා ගමන් කරන්න. නමුත් අපි මොන වෙලාවකවත් අවකාශ නොදිය යුතුයි ඒ සුළඟින් අපේ නිවස බිඳ වැටෙන්ට. ගාන්ධි තුමාගේ ප්‍රකාශයේ විශේෂ අර්ථයක් තිබෙනවා, අපි කවුරුත් මතක තියා ගන්න. මගේ හිතේ පොත පත සම්බන්ධයෙනුත් ඒ හැඟීම අපි ඇති කර ගන්න ඕනේ. පොත පත අවශ්‍ය යි. අපේ දැනීම වැඩි දියුණු කර ගන්න. නමුත් ඒ දැනීමෙන් අපි මන්මත් නො විය යුතු යි.** දැනීම් සම්භාරයෙන් අපේ මොළය පුරවා ගෙන, ඒ දැනුම උඩ ඉඳ ගෙන අපි නොයෙකුත් විෂයයන් ගැන හිතන්නට ගියොත් අපි ඒ දැනුමට වහල් වෙනවා. බොහෝ විට මං කල්පනා කරනවා මේ දැනුම කියන එක අපි පාවිච්චි කරන්නෙ අපේ වහලෙක් හැටියට ද, එහෙම නැත්නම් අපි දැනුමට වහල් වෙලා සිටිනවා ද?

අද මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් ගේ මතකය අළුත් කෙරෙන අංශයක් මේ පුස්තකාල ගොඩනැගිල්ලේ දී විවෘත කරන්නට යෙදුණා. මාර්ටින් වික්‍රමසිංහ මැතිණිය මෙහි සිටිනවා. එතුමිය මං හොඳට දන්නවා අඳුනනවා. මොකද පාසල් වියේ ඉඳලම අපි නිතර නිතර මාර්ටින් වික්‍රමසිංහ මැතිතුමාව හමු වන්ට ගිය නිසා. එතුමාගෙන් හුඟක් දේ ඉගෙන ගත්ත නිසා. දැන් එතුමිය හොඳට දන්නවා, මාර්ටින් වික්‍රමසිංහ මැතිතුමාගේ පොත පත කියවපු තමුන්නාන්සේලා දන්නවා එතුමා පාවිච්චි කළ වචනයක් තිබෙනවා, 'අදීන' කියන වචනය. 'අදීන'. 'දීන' නොවී, වහල් නොවී, මොනම දේකටවත් ස්වාධීනව කල්පනා කරන්ට පෙළඹෙන්ටෙයි කියන හැඟීම මාර්ටින් වික්‍රමසිංහ මැතිතුමා බොහෝ විට අපට මතක් කළ දෙයක්. එහෙම කල්පනා කරන කොට අපි දැනුමට වහල් විය යුතු ද? එහෙම නැත්නම් දැනුම වහලෙක් කර ගෙන අපි ''අදීනව'' ඒ විෂයයන් පිළිබඳව කල්පනා කළ යුතු නේ ද? ඒ නිසා මේ පුස්තකාල සේවාවේ දී පුස්තකාලයාධිපතිවරු, එහෙම නැත්නම් පාසැල්වල දී අපේ ගුරුවරු, අපේ දරුවන්ට අවබෝධ කරදිය යුතු දෙයක් මේක. තොරතුරු දැන කියා ගන්නට, ඒ දැනුම් සම්භාරය අවශ්‍ය යි. නමුත් යම් විෂයයක් ගැන හිතන විට ඒ දැනුමට වහල් වෙන්ට එපා. තමන්, අර ''තම තම නැණ පමණින් දැන ගත යුතු'' කිව්වා වාගේ, තමන් ඒ ගැන අළුතෙන් හිතන්ට උත්සාහ කරන්ට. බොහෝ විට අපට පෙනෙනවා නොයෙක් කරුණු පිළිබඳ අපි තර්ක විතර්ක ඉදිරිපත් කරන්ට: මීට ඉස්සර, අහවල් කාලෙදි, අහවල් එක්කෙනා, අහවල් කාරණය ගැන, මේ විදියට කියල තියෙනව, ඒ නිසා මේක හරි යන්ට ඕනැය කියලා. ඒ නිසා මේක මෙහෙම විය යුතු ය කියලා කියවනා මිසක්, මෙහෙමත් කියැවෙලා තියෙනවා, ඒක ඒ කාලේ, ඒ තිබුණ තත්ත්වය අනුව මෙහෙම වට පිටාව අනුව එහෙම හිතල ලිව්ව ඒක. නමුත් ඒකෙ විකාශනය බලල, අද යුගයට ගැලපෙන විදියට ඒ ගැන සමාලෝචනයක් කරන්ට ''අදීනව'' පෙළඹෙන්ට අපි උත්සාහ කරන්ට ඕනෑ. ඒක තමයි බොහෝ විට අපේ පාසැල්වල දී අපේ ගුරුවරු අපේ හිත්වලට ඇතුල් කරන්ට හුඟක් උත්සාහ කළේ. දැන් අපේ රටට ඉතාම දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. ආඩම්බර විය හැකි ඉතිහාසයක් තියෙනවා. අවුරුදු 2500 කට එහා යන, ලියැවුණු ඉතිහාසයක් තියෙනවා. නොලියැවුණු ඉතිහාසයකින් තවත් ඈතට යනවා. දැන් මෙහෙම සංකේත තිබුණා ප්‍රාග් ඉතිහාසය යුගය ගැන එහෙම, බලංගොඩ මානවයා ඔස්සේ ගිහිල්ලා බලන කොට අපේ ඉතිහාසය කොයි තරම් දුරට යනවා ද කියලා තමුන්නාන්සේලා දන්නවා. සමහර වෙලාවක මට හිතෙනවා, අපේ ඉදිරි ගමනට තියෙන ලොකුම අමාරුව, අපට මේ දීර්ඝ ඉතිහාසය–දෝත් කියලා. මොකද ඒ බර නිසා මේ කන්ද නැග ගන්නට බැරුව අපි ඉන්නවා වාගේ. සමහර වෙලාවට දැන් අපට වඩා ඉදිරියට ගිහිල්ලා තියනවා නොයෙක් අතින් ඇතැම් රටවල් ඒ තරම් දුර ඉතිහාසයක් නැහැ. ඒ නිසා සැහැල්ලුවක් වෙන්ට පුළුවනි ඒ අයට ඒ බර අඩුවීම. අපට බොහෝ විට ඇතැම් විට අපේ දැනුමත් අපි බරක් කර ගන්නවා. ඒ නිසා අපට යථාර්ථයෙන් හිතන්නට, ප්‍රායෝගිකව කල්පනා කරන්නට බැරිකමකුත් ඇති වෙන්නට පුළුවනි. මොකද, දැනුම් සම්භාරය ඒ තරම්. ඒකෙන් ඒ බරෙන් හෙම්බත් වෙලා, තැලිලා, මිරිකිලා ඉන්නවා. ඒ නිසා මේ ගමන යා ගන්න බැරුව ඉන්නවා. ඒ තරමටම දැනුම වැඩියි. ඒ දැනුම වහලෙක් කර ගන්නේ නැතිව, දැනුමට වහල් වෙන්න. ඒ නිසා මේ ගැන අපි ටිකක් කල්පනා කරමු. අපේ ඉතිහාසයෙන් අපට ලැබිලා තිබෙන සම්පත වගේම, දැනුමෙන් ලබන සම්පතත් අපේ විපතකට අපි හරවාගන්නට නරකයි. ඒවා ගැන තොරතුරු දැන ගැනීම අවශ්‍යයි. නමුත් ඒ ප්‍රස්තුත ප්‍රශ්නය ගැන හිතන විට ඒ දැනුමට අපි වහල් නො විය යුතු යි. එහෙම වහල් වුණොත්, එහෙනම් අපි යම් වැරදි මතයක් ලියැවුණා නම්, කියැවුණා නම්, මුද්‍රණය වුණා නම් ඒ වැරදි මතය උඩ තවත් වැරදි කර කර උඩට යනවා මිසක්, ඒක ගැන තුලනාත්මකව කල්පනා කරන්නේ නැහැ. ඒ නිසා වැරදි තීරණත් අපි ඇති කර ගන්නට පුළුවන්.

මේ ජාතික පුස්තකාල වැඩ පිළිවෙලේ දී මේ විධියේ අදීනත්වයක් ඇති කිරීමට උවමනා කරන පාඩම් මාලාවක් සකස් කෙරෙන්ට ඕනේ. පොතක් කියවන හැටි, ඒ පොතේ කරුණු සටහන් කරන හැටි, තබා ගන්නා හැටි, ඒවා ගැන දැනුමක් විශේෂයෙන්ම අපේ දරුවන්ට ලබා දීමට ඕන කරන එවැනි පාඨමාලා සකස් කරලා පුස්තකාල පද්ධතියටම අපි යැවිය යුතුව තිබෙනවා. ඒක ජාතික සේවාවක්, මෙවැනි පුස්තකාලයකින්. විශේෂයෙන්ම මේ දැනුමෙහි කියල කියන එක අපේ ස්වාමියෙක් කර ගන්නට නරකයි. එය වහලෙක් කරගත යුතුයි. මේ අතින් හුඟක් කරුණු ඉදිරිපත් කළ විද්වතෙක් තමයි මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්. එතුමා මෑත කාලයක මගෙ හිතේ පොත පත කියවීම අතින් වෙනත් කිසිවකුට දෙවැනි නොවන තත්ත්වයක් තිබුණෙ. බොහෝ පොත පත කියවන්ට ඇති. බොහෝ තොරතුරු කියන්ට ඇති. එය මං පුද්ගලිකවම දන්නවා. නමුත් ඒ මඟින් දැන ගත්ත දැනුමට වහල් වුණේ නැති බව එතුමාගේ පොතපතින් අපට අවබෝධ කර ගන්නට පුළුවන්. බොහෝ විට අපි එතුමාගේ විග්‍රහයන් අනුමත කරල නැහැ. ඒවාට පටහැනිව අදහස් ප්‍රකාශ වෙලත් තිබෙනවා. නමුත් ඒක වෙනම කායිකයක්. නමුත් එතුමා අදීනව හිතන්ට පුරුදු වෙච්ච කෙනෙක්. ඒ ආභාෂය අපි ලබා ගන්ට ඕනේ. ඒ නිසා මං ඉතා සතුටුයි අද දවසෙදි මේ ජාතික පුස්තකාලයේ එතුමා වෙනුවෙන් වෙනම කුටියක් ඇති වීම. ඒ කුටියෙන් ලබන ආභාෂය නම්, **දැනුම අපි වහලෙක් කර ගත යුතුයි, දැනුමට අපි වහල් නොවිය යුතුයි, අදීනව සිතන්නට පුරුදු විය යුතුයි කියන ආදර්ශ පාඨය කියලයි මං කල්පනා කරන්නෙ.**

තමුන්නාන්සේලා දන්නවා පොතක් ලියන විට දැන් පොත්වලින් තමයි පුස්තකාලයක් සකස් වෙන්නෙ. නමුත් පොතක් ලියන විට බොහෝ විද්වතුන් පුස්තකාලයක පොත් හුහාක් පෙරළලා බලනවා. **සැමුවෙල් ජොන්සන් එක වරක් කිව්වා, පොතක් ලියන එක්කෙනා සමහර විට පුස්තකාලයක භාගයක් ම හාරා අවුස්සනවයි කියලා. මට අද වගේ මතකයි ඒ කියමන** "The man will turn over half a Library to make one book." **ඒ ගවේෂණ. සොයා බලනවා. මොනවා ද මේ විෂය ගැන නොයෙක් අය කිව්වේ. ඒ කියපු දේවල්ම අනුකරණය කරල, අනුගමනය කරන්ට ලියන්නෙ නෑ. ඒ ගැන නැවතත් හිතනවා.**

ප්‍රතිවිරුද්ධ පැත්ත ගැන කල්පනා කරනවා. ඒකට අළුත් තේරුමක් දෙන්ට බලනවා. උත්සාහ කරනවා. එහෙම තමයි අපි නිරන්තරයෙන්ම කලපනා කරන්නෙ. අපි යුගයේ අවශ්‍යතාවන් ගැනත් කල්පනා කරන්ට ඕනේ. යුගයේ අවශ්‍යතාවන් ඒ යුගයේ අවශ්‍යතාවන්ට උවමනා කරන විග්‍රහයන් අපි කරන්ට ඕනේ. අපි ලබන දැනුම අනුකරණයෙන්ම දිගෙන් දිගටම ඒ අනුගමනය කිරීම නොව, ඒ ගැන වෙනත් පැතිවලින් හිතන්ට අපි පුරුදු පුහුණු කරන්ට ඕනෙ. අපේ හැදී වැඩී ගෙන එන පරම්පරාවට නැත්නම් කල්පනා කරලා බලන්න, එක යුගයක ඉතිහාසය කියවන එක්කෙනෙක් තව අවුරුදු දහස් ගාණක පැරණි ඉතිහාසයක්, ඒ ඉතිහාසය තුළ ගැබ් වී තිබෙන සිදුවීම් ගැන කල්පනා කරල බලන්න. ඒ සිදුවීම් ඒ සටහන් මගින් යුගයෙන් යුගය ඉස්සරහට ඇවිල්ල, අද ලෝකය හුහාක් වෙනස් වෙලා: අභියෝග අර්බුද වෙනස් වෙලා, තිබෙන යුගයක දී අර අවුරුදු දහස් ගණනකට ඉස්සර ඇති වෙච්ච සිද්ධිය, ඒ ඉතිහාසයට වහල් වෙලා වර්තමාන ප්‍රශ්නවලට මුහුණ දෙන්ට ගියොත් එහෙනම් වැරදි තීරණයක් කරන්ට වෙන්නෙ. ඊට වඩා වෙනස් යුගයක් උදා වෙලා තියෙන්නෙ. පරිවර්තන රාශියක් ඇති වෙලා තියෙනවා. අර මෙහෙ අපට බලන්ට පුළුවන් අපගේ අක්ෂර වින්‍යාසය. මොන ආකාරයකට වෙනස් වෙවී, වෙනස් වෙවී, වෙනස් වෙවී, වෙනස් වෙවී ආවද කියල. එහෙම කල්පනා කරලා ඒ යුගයේ අවශ්‍යතාවට ගැලපෙන විදියට හිතන්ට අපි පුරුදු වෙන්ට ඕනෙ, වෙනත් යුගයක ඇති වෙච්ච සිද්ධි පිළිබඳ දැනුම් සම්භාරයෙන් හෙම්බත් වෙලා, මිරිකිලා, වහල් වෙලා, යුගයේ අවශ්‍යතාවන්වලට, අර්බුදවලට නැත්නම් අභියෝගවලට මුහුණ පාන්නට පුළුවන්කමක් ඇති වෙන්න. ඒ නිසා පුස්තකාල පොත් පත්, ලිපි ලේඛන අත්‍යවශ්‍ය යි. ඒවා රැක ගත යුතු යි. ඒවා පිළිබඳ පර්යේෂණ පැවැත් විය යුතු යි. මේ වැනි දෙයක් මේ යුගයේ ඇති වෙන්නට හේතු භූත වුන කාරණා මොනවා ද? එදා තිබිච්ච අවශ්‍යතාවය මොකක් ද? එදා තිබුණ වාතාවරණය මොකක් ද? එදා භූගෝලය මොකක් ද? එදා තිබිච්ච ප්‍රශ්න මොනවා ද? ඒ නිසා මේ සිද්ධිය මේ විදියට වුණා. ඒ ආකාරයටම එය මේ යුගයේදීත් අපි අනුගමනය කළ යුතු ද? මෙන්න මේව ගැන විශේෂ පර්යේෂණ කළ යුතුව තිබෙනවා. අත්හදා බැලීම් කළ යුතුව තිබෙනවා. එවැනි තොරතුරු ලබා ගැනීමට පුළුවන්කම් තියෙන්ට ඕනෙ. අන්න එහෙම කල්පනා කරන කොටයි මේ ජාතික පුස්තකාලයේ වටිනාකම අපිට තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ.

මම මෙහි අධිකාරීන්ගෙන් ඉල්ලා සිටිනවා මෙය තවත් එක් පුස්තකාලයක් බවට පත් කරන්නට එපාය කියලා. මේ පුස්තකාලය ජාතික පුස්තකාලයක්. මේ පුස්තකාලය සෙසු පුස්තකාලවලට පෙර මහක් යොමු කරන, ඊට උවමනා කරන මාර්ගෝපදේශකත්වය දෙන පුස්තකාලයක් බවට පත් වෙනවා. එහෙම නැත්නම් දැන් කොළඹ නගර සභාවේ පුස්තකාලය වාගේ තවත් පුස්තකාලයක් කියල මෙතන වැරදි අවබෝධයක් අපි ඇති කර ගන්නවා. මෙහි තිබෙන විශේෂත්වය, විශිෂ්ඨත්වය අපි අවබෝධ කර ගන්න ඕනේ. මං දන්නවා මේ විෂය භාරව සිටින සුනේත්‍රා රණසිංහ ඇමතිතුමිය මේ ගැන විශේෂයෙන්ම කල්පනා කරලා ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙලවල් යොදා ගන්න ඒ පිළිබඳ විශේෂඥයන්ගේ උපදෙස් ලබා ගන්නට ඕනේ. අපේ රටේ ඉන්නවා. ඒ අතින් කල්පනා කළොත් අපි කාටත් ආඩම්බර වෙන්ට පුළුවන් දැනුම් තේරුම් ඇති විද්වතුන්, බුද්ධිමතුන් සිටිනවා. එතුමන්ලාගේ සේවය අපි ලබා ගන්න ඕනේ. එහෙම කළොත් අපිට මේ ජාතික පුස්තකාලයේ නියම ප්‍රයෝජනය ලබා ගන්නට පුළුවන්. සියළු දෙනාටම බොහොම ස්තුතියි!



We are very grateful to the Representatives of our friendly countries the Diplomats who are here who have helped us in improving the standards of our Library Services in Sri Lanka. This National Library building is a long felt need. The Government has spent about Rs. 55 million in constructing this building. The construction was delayed due to unavoidable circumstances. But now we can be proud that we have a suitable building to house our National Library. Mr. I.M.R.A. Iriyagolla who was Minister during the 1965–70 Government over the Minister of Education, initiated the Sri Lanka National Library Service and with that initiative we were able to provide a suitable building for the National Library. This National Library is charged with several responsibilities. It has to play a very important role in preserving Information, Documents and Publications and also making re-search into various aspects of Social Progress and I am happy that we have been able to obtain the services of Mrs. Ishvari Corea who is one of our very experienced Librarians in this country and the other Officials who are serving this National Library with great dedication. Now a National Library Service of this nature has to perform as I said earlier, a very important task in with the cooperation of the National Archives. Now we can obtain the services of specialists from other countries. Now we have at the priviledge of getting the services of experts from our friendly countries like Australia, Japan, Singapore, Malaysia, India, Soviet Union and the United Kingdom. We are very grateful to these countries for the assistance they are rendered.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයේ දී

ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය

ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා පවත්වනු ලැබූ කථාව



ගරුතර මහා සංඝ රත්නයෙන් අවසරයි,
පූජකවරුනි,
ශ්‍රීමත් ජනාධිපතිතුමනි,
සහෝදර මැති ඇමතිවරුනි,
ආරාධිත අමුත්තනි,
නෝනාවරුනි, මහත්වරුනි.

මේ ජාතික පුස්තකාලය විවෘත කරන්ට පෙර, මාසයක් යන්ටත් ඉස්සෙල්ලා, මට අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ධුරය ලැබී මේ උත්සවයට මේ ආකාරයෙන් සහභාගි වෙන්ට ලැබීම මගේ පූර්ව පිනක් හැටියට යි මම සලකන්නේ. වෙන කොයි ආකාරයකින් බැලුවත්, රටක ජාතික පුස්තකාලයක් විවෘත කරනවා යි කියන එක ඒ රටේ බුද්ධිමය ඉතිහාසයේ වෙනත් කරුණක් එක්ක සසඳන්ට අමාරු සිද්ධියක් හැටියට අපි අවිවාදයෙන් පිළිගන්නට ඕනේ. මේ වේලාවේ මට විශේෂයෙන් ම මතක් වෙන්නේ මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවා කරපු හැමෝම, අතර, විශේෂයෙන් ම ජාතික පුස්තකාලයක් පිහිටුවන්න ඕනෑ යි කියන අදහස ඉදිරිපත් කරමින් පනතක් ඉදිරිපත් කරපු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල ඇමතිතුමා ඒ වගේ ම මේ පුස්තකාලය ඉදි කිරීමට විශේෂ සේවාවක් කරපු දිවංගත ලයනල් ජයතිලක ඇමතිතුමත් මට මතක් වෙනවා. ඒ නිසා මම විශේෂයෙන් සන්තෝෂයි මේ ජාතික පුස්තකාලය ලයනල් ජයතිලක අනුස්මරණ පුස්තකාලය හැටියට අපි නම් කිරීම ගැන. ඒ දෙපක්ෂයම පාර්ලිමේන්තුවට ආවෙත්, ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට විශේෂ සේවාවක් ඉටු කරපු ප්‍රදේශයක්, එනම් කුලියාපිටිය ප්‍රදේශයෙන්.

අපි පුස්තකාලයක් විවෘත කරන කොට අපි ස්වභාවයෙන් කල්පනා කළ යුතු කරුණක් තමයි ලෝක ඉතිහාසයේ මිනිහත් පොතත් අතර තිබෙන තිබුණ සම්බන්ධය. ඒ ඉතිහාසය දිහා බැලුවම මිනිහා ලියන්න ඉගෙන ගත්ත දා ඉඳලා අද වෙන තුරු ඒක නවත්වන්ට බැරි විවිධ ආකාරයෙන් ගැඹුරු වන සම්බන්ධකමක් තිබෙන්නේ මිනිහත් පොතත් අතරේ. මිනිසා එහෙනම් එක්තරා විධියකින් යම්කිසි සමාජයක, ශිෂ්ඨාචාරයක මනුෂ්‍යත්වය අපට හඳුන්වා දෙන ප්‍රධාන ආකාරයක් තමයි පොත පතෙන් ලියැවෙන දේ.

ලෝක ඉතිහාසයේ ඒවා අපට හොයන්න පුළුවන්. ශිෂ්ඨාචාරය හැදුනා. විශාල පුස්තකාල ඇති වුණා. නමුත් ඒවත් මනුෂ්‍ය සටන් නිසා ඒවා නැති වෙලා ගියා. ලෝකය දිහා බැලුවම, ඇලෙක්සැන්ඩ්‍රියාවේ සුප්‍රසිද්ධ පුස්තකාල තිබුණා. ඒවා නැති වී ගියා. දකුණු ආසියාවේ ඉතිහාසය බැලුවොත් නාලන්දාවෙත් පුස්තකාල තිබුණා. මුළු පළාතට ම ප්‍රසිද්ධ පුස්තකාල, නමුත් මනුෂ්‍යයාගේ සටන් නිසා ඒවා නැති වී ගියා. ලංකා ඉතිහාසය බැලුවොත් මම කියවලා තියෙන විදියට ජේතවන විහාරයේත්, අභයගිරිය විහාරයේත් අතර තිබුණ විවාද හා සටන් නිසා ඒ කාලේ තිබුණ පුස්තකාල හුගක් නැති වෙලා ගියා. එම නිසා අපිට ඒ කාලේ තිබුණ සාහිත්‍යයේත් සමහර කරුණු සදා කාලෙම නැති වී ගියා. අනිත් පැත්තෙන් අපිට ඉතිහාසයේ හොයන්නට පුළුවන් සමාජයක්, ඒ සමාජයේ මනුෂ්‍යයන්ගේ ජීවිතය පරිත්‍යාග කරමින් පොත පතයි පුස්තකාලයයි ආරක්ෂා කෙරුවා.

ළඟ ඉතිහාසයේත් හොඳම උදාහරණය දෙවැනි මහා යුද්ධයේත් ලෙනින්ග්‍රෑඩ් නුවර ඒ පුස්තකාල ආරක්ෂා කරන්න රුසියාවේ ජනතාව සටන් කරපු ආකාරය. මනුෂ්‍යයා අද සිටින්නේ දැනුම පිළිබඳ විප්ලවයක් ඇති වෙන කාලයක. ලෝකයේ හැම වෙලාවෙම ඔය වගේ දැනුම වැඩි වුණා. මේ ශත වර්ෂයේත්, විශේෂයෙන් මේ ගිය අවුරුදු තිහ හතළිහේත් කවදාවත් වුණ නැති දෙයක් මෙතරම් වේගයෙන් ලෝකයේ දැනුම වැඩි වෙලා තිබෙනවා. ඒක නොනැවතී යනවා. ඒ වගේ දැනුමක් වැඩි වෙන යුගයක දැනුම් දීමේ ක්‍රම විප්ලවවාදී වෙනසක් වේගෙන යනවා. ඒ කාලයේ වැඩි බුද්ධියක් තිබුණ. පොත් පත් කියවා තිබුණ අය ස්වල්ප දෙනයි. අද ලෝකය ඒක පිළිගන්නේ නැහැ. අද ලෝකයේ තිබෙන බුද්ධිමය වස්තුව ප්‍රජාතන්ත්‍රවාදීව හැමෝටම දෙන්ට උත්සාහ කළ යුතු යි කියන අදහස අද පැතිරී ගිහිල්ලා තිබෙන්නෙ. ලංකාවේ ඔය ප්‍රශ්නය තිබෙනවා. ඒක නිසා තමයි අධ්‍යාපනය තවත් ප්‍රජාතන්ත්‍රවාදීව කළ යුතු යි කියන අදහස අද ඉස්මතු වෙන්නේ. කාරණයක් අපි ගත්තොත් මේ දවස්වල තිබෙන උදාහරණය ගත්තොත් විශ්ව විද්‍යාලයට සුදුසු යි කියල තේරෙන හැමෝටම විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන්ට බැරිවීම මුලු රටටම පාඩුවක් කියල අද ජනතාව පිළි ගන්නවා. පුස්තකාලයක් එහෙනම් එක පැත්තකින් ලොකයේ වැඩි වෙන දැනුම රටට එකතු කරලා. එක් රැස් කරලා දෙන්න ඕනෑ. ලෝකයේ බුද්ධියත් එක්ක සම්බන්ධ වෙන ස්ථානයක් තමයි මේ. අනිත් පැත්තෙන් ලංකාවේ ජාතික පුස්තකාලය නිසා ලංකාවේ විශේෂත්වයත් සංකේත කර ලංකාවේ බුද්ධිමය විශේෂත්වයත් ලෝකයට දෙන ස්ථානය තමයි මේක. පුස්තකාලයට මේ විධියට වගකීම් අඩු වශයෙන් දෙකක් තිබෙනවා. ලංකාවේ බුද්ධියම පිළිබඳ ප්‍රශ්න මීට පෙර වගේ ස්වල්ප දෙනෙකුගේ ප්‍රශ්නයක් වෙන්ට බැහැ ටික දෙනෙක් ලොකු ඉගෙනීමක් ලබා ගැනීමෙන් ඒ රටට ප්‍රයෝජනයක් වෙන්නෙ නැහැ. මෙතන පුස්තකාලයක්

අවශ්‍ය හැම පොතම තිබීමෙන් අපට උපරිම ප්‍රයෝජනය ලබා ගන්න බැහැ. එසේ නම් මේ වගේ පුස්තකාලයක තිබෙන ප්‍රශ්නයක් එක්තරා විදියකින් අර්බුදයක් තමයි මේ තිබෙන දැනුම මුළු ලංකාවටම දැනුම් දෙන්නේ කොහොමද කියන එක.

ඒ අභියෝගය අපි පිළිගන්ට ඕනෙ. බුද්ධිමය පිළිබඳ, සංස්කෘතිය පිළිබඳ දැනුම් දීම් පිළිබඳ වැඩ කරන හැමෝම මේ ලංකාවෙ හැමෝටම, කැමැත්තක් ඒ අයට තියෙනවා නම්, මේ ලංකාවේ තිබෙන බුද්ධිමය රැස් කරන ස්ථානවලට පැමිණි ඒ තිබෙන වස්තුවෙන් ප්‍රයෝජනය ගන්නට අපි සකස් කරන්නට සිදු වෙනවා. මේක ඉතින් අපිට එදාට වඩා ටිකක් ලේසියි. මොකද දැනුම් දීම් ක්‍රමය තාක්ෂණය නිසා විප්ලවීය වෙනසක් වෙනවා. **"Communication Technology"** කියන එක අපි කවදාක්වත් හිතපු නැති විදියට වෙනස් වේගෙන යනවා. ඒකේ උපරිම මට්ටමට අපි ප්‍රයෝජනයට ගන්නට ඕනේ. පුස්තකාලයක් විවෘත කරන කොට මට මතක් වෙනවා අවසාන වශයෙන් ජනාධිපතිතුමනි, ඔබ තුමාගේ ජීවිතය හුහක් සකස් වුණේ මහත්මා ගාන්ධි තුමාගේ අදහස් උදහස්වලට. ඔබ තුමා දැන් ක්‍රියාත්මක කරන්නේ හිංසා වාදයෙන් තොර, මේ රටේ ප්‍රශ්න විසඳන්ට මහත්මා ගාන්ධි, සංස්කෘතිය ගැන කියපු දෙයක්, මම සිංහලෙනුයි ඉංග්‍රීසියෙනුයි කියල තමයි මගේ කථාව අවසාන කරන්න අදහස් කරන්නෙ. පුස්තකාලයක් විවෘත කරනකොට මං හිතන්නේ අදාළයි, එතුමා කිව්වා

"I shall open my windows, so that the winds of the world will blow in it my house, But I refuse to be blown off my feet."

ඒ කිව්වේ, ''මගේ ජනෙල් ලෝකයේ සුළංවලට මං විවෘත කරනවා. නමුත් මා ඒ හුළඟේ වේගයෙන් වැටෙන්ට ලෑස්ති නෑ.''

ඒ කියන්නේ ලෝකයේ සංස්කෘතිය සම්බන්ධ දැනුමට අපි විවෘතව සිටිය යුතුයි. නමුත් ඒකෙන් ඇති වෙන ප්‍රශ්න නිසා අපි කවදාවක්වත් අපේ විශේෂත්වය අපි නැති කර ගන්නෙ නැහැ. ඒ අභියෝගය ඊශ්වරී කොරයා මහත්මියගේ නායකත්වය යටතේ වැඩ කරන මේ හැමෝම පිළිගනියි කියලා මම විශ්වාසය පළ කරමින් මම නිශ්ශබ්ද වෙන්න කැමතියි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයේ දී ගරු අධ්‍යාපන සේවා අමාත්‍ය සුනේත්‍රා රණසිංහ මැතිතුමිය පවත්වනු ලැබූ කථාව

මහා සංඝරත්නය ඇතුළු අනිකුත් පූජක තුමන්ලාගෙන් අවසරයි
ශ්‍රීමත් ජනාධිපතිතුමනි, ගරු ඇමතිවරුනි, සම්භාවනීය අමුත්තනි,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපතිතුමා,
වැඩ බලන අධ්‍යක්ෂතුමා ඇතුළු නෝනාවරුනි, මහත්වරුනි.

අද දින ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට අයත් මේ නව ගොඩනැගිල්ල විවෘත කරන අවස්ථාවේ, ඔබත් සමග එම උත්සවයට සහභාගි වීමට අවස්ථාවක් ලැබීම ගැනත්, විශේෂයෙන් ම එම විෂය භාර ඇමැතිනිය වශයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාවක් ලැබීම ගැනත් මා ඉතාමත් සන්තෝෂ වෙනවා. ශ්‍රී ලංකාවේ පුස්තකාල මණ්ඩලය අද එහි තිබුණු තවත් අඩුපාඩුවක් සම්පූර්ණ කරමින් පුස්තකාලයක් තුළින් රටේ ජනතාවට ලබා දිය යුතු උපරිම සේවය සලසා දීම සඳහා අද, නව ගොඩනැගිල්ලකට පිවිසිලා එය ශ්‍රීමත් ජනාධිපති තුමාණන්ගේ අතින් විවෘත වූ වැදගත් අවස්ථාවයි මේ මොහොත. අපි කවුරුත් දන්නවා **ශ්‍රී ලංකා රජය විශාලමුදල් සම්භාරයක් වියදම් කරලා මේ දර්ශනීය ගොඩනැගිල්ල පුස්තකාලයකට අවශ්‍ය සෑම දෙයකින් ම සම්පූර්ණව, අද පුස්තකාලයකින් ඒ ලබා ගත යුතු ප්‍රයෝජනය ලබා ගැනීමට එන පිරිස සඳහා විවෘත කළා, එහෙනම් අපි මේ වැදගත් අවස්ථාවේ විශේෂයෙන් ම මතක් කරන්න ඕනෑ මේ අවස්ථාව අපට සලසා දීමට එහි මූලික කටයුතු ආරම්භ කරපු අය. එදා එවකට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාවරයා ලෙස කටයුතු කරපු ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මැතිතුමා, ඒ වාගේ ම ගරු ලයනල් ජයතිලක මැතිතුමා අපි මේ අවස්ථාවේ විශේෂයෙන් ම කෘතඥ පූර්වකව සිහි කළයුතු දෙදෙනෙක් කියා මම විශ්වාස කරනවා.**

ඒ අයගේ උනන්දුව, විශාල උනන්දුව, ඒ වගේ ම ඒ අයගේ උත්සාහය නිසා අපට අද මේ අවස්ථාවට සහභාගි වෙලා සන්තෝෂ වෙන්න පුළුවන් ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයක් අද ලස්සනට තියෙනවා කියලා. ඒ වගේ ම අපි සන්තෝෂ වෙන්ට ඕනෑ මෙ අවස්ථාව තවත් අලංකාර කර ගැනීමට ශ්‍රීමත් ජනාධිපතිතුමාණන් අපත් සමග අද මෙහි පැමිණ සිටීම ගැන **ඇත්ත වශයෙන්ම ජනාධිපතිතුමනි, මේ පුස්තකාල සේවා මණ්ඩලය භාර සභාපතිතුමියත්, ඒ වැඩ බලන අධ්‍යක්ෂක තුමාත්, එම කායර්ය මණ්ඩලයත් විශාල උනන්දුවකින්, කැපවීමකින් අද මේ අවස්ථාව සඳහා විශාල වැඩ කොටසක් කරයි කිව්වොත් එය සත්‍යයක්.** මම කිහිප වරක් ම මෙහි පැමිණුනා, මේ වැඩ කටයුතු කර ගෙන යන හැටි සෝදිසි කිරීමට. මට ඒ හැම අවස්ථාවක ම පෙණුනේ මේ පුස්තකාලයෙන් ජනතාවට ලබා දිය යුතු සේවය උපරිමයෙන් ලබා දීමට ඉතාමත් ම උනන්දුවෙන්, කැප වීමකින් කටයුතු කරන සභාපතිතුමියක් ඇතුළු කායර්ය මණ්ඩලයක්. එහෙනම් අපට විශ්වාස කරන්න පුළුවන්, බලාපොරොත්තු තියන්ට පුළුවන් මේ පුස්තකාලය සඳහා රජයේ විශාල මුදලක් වැය කරලා, මේ ලබා දුන්න පුස්තකාලයෙන් ජනතාවට ප්‍රයෝජනයක් ගන්නට අවස්ථාවක් සැලසෙයි කියලා. මට දැන ගන්නට ලැබිල තියෙන විධියට මේ පුස්තකාලයේ තියෙන ඒ පොත් පත් ශ්‍රී ලංකාවේ ඕනෑම පළාතක සිටින පුස්තකාලයකින් පොතක් බලන්ට ඕනෑ කෙනෙක්, තමන්ගේ පළාතේ ඉඳලා දන්වා එව්වා ම මේ පුස්තකාලය මගින් ඒ අනිත් පුස්තකාලවලට පොත් ලබා දෙමින් ඒ අවස්ථාව ඉටු කර දීමට කටයුතු කරනවා. එ වගේ ම මේ ස්ථානයට ඇවිල්ලා නිසංසලව තමන් ඒ බලන්න ඕනෑ ඒ පොත බලා ගන්න හොඳ පහසුකම් සහිතව අවස්ථාවක් සැලසිලා තියෙනවා. එහෙනම් මෙතෙක් අපේ රටේ එවැනි පහසුකම් බලාපොරොත්තු වී සිටිය, උසස් අධ්‍යාපනයට තව තවත් දේ එකතු කර ගැනීමට අවශ්‍යව සිටි පිරිසට අද ඒ පහසුකම් මේ ස්ථානයේ සැලසිලා තියෙනවා. අපි කවුරුත් දන්නවා, වර්තමාන රජය, ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ, පාසැල් යන පුංචි දරුවාගේ ඉඳලා උසස් අධ්‍යාපනයක් දක්වා **යන අපේ තරුණ පිරිස දක්වා පුළුවන්** තරම් හොඳට ඒ අය රටේ උගතුන් ලෙස බිහි කිරීමට ප්‍රයත්නයක් දරනව යි කියලා. එහි තවත් එක් පියවරක් හැටියට මේ අවස්ථාව හඳුන්වන්න පුළුවන්. අද වර්තමාන ශ්‍රී ලංකාවට ජනතාව බලාපොරොත්තු වෙච්ච සාමය, සතුට, සමාදානය උදා වෙමින් ජනතාව සන්තෝෂමත් වෙන මොහොතක උසස් අධ්‍යාපන ආයතන ටිකින් ටික ක්‍රියාත්මක වෙලා, රටේ තිබෙන අඩුපාඩු, රටට අඩු උගතුන් බිහි කරන අවස්ථාවක මෙ වැනි පුස්තකාලයකින් ලබා ගන්න පුළුවන් සේවය උපරිම යි.

ඒ වගේ ම මං ජනතාවට මතක් කරනවා එම විෂය භාර ඇමැතිනිය වශයෙන්, අපට මේ ලැබෙන පහසුකම්වලින් උපරිම සේවයක් ගන්නවා වගේම ඒ ආයතනය තමන්ගේම දෙයක් කියලා හිතා ගෙන මෙය ප්‍රයෝජනයට ගන්න එන පිරිසත්, හොඳින් පරිහරණය කළොත් අපට වර්ෂ ගණනාවකට මෙහි තියෙන වැදගත් පොත්වලින් ප්‍රයෝජනයක් ගන්න පුළුවන්. තව අඩුපාඩු තියෙනවා. ඒවා සම්පූර්ණ කිරීමට පුස්තකාල මණ්ඩලය කටයුතු කර ගෙන යනවා. එහෙනම් අපි කවුරුත් එක්ක එකතු වුණොත් මේ වැදගත් ආයතනය තුළින් විශාල මෙහෙයක් රටට ඉටු කර ගන්න පුළුවන්, කියන එකයි මගේ විශ්වාසය.

මං දීර්ඝ වශයෙන් කථා කිරීමට බලාපොරොත්තු වෙන්නේ නෑ. මේ අවස්ථාවට සහභාගි වී තමුන්නාන්සේලා හමුවේ වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මගේ ස්තුතිය ප්‍රකාශ කරන අතර, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අද විවෘත කරපු මේ ගොඩනැගිල්ලෙන් අපේ රටේ ජනතාවට විශාල සේවයක් සැලසේවා යි ප්‍රාර්ථනා කරමින් මං නවතිනවා.

ජාතික පුස්තකාලය විවෘත කිරීම ජනතාවට දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක දී

ජාතික පුස්තකාලය විවෘත කිරීම නිමිත්තෙන් පැවති පිරිත් පිංකමේ දී

සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනයේ දී

ජනාධිපතිතුමා ප්‍රදර්ශනය නරඹමින්

අයනු කී අයනනේ .....
ජනාධිපතිතුමා වැලිපිල්ලේ අකුරු ලියමින්

ජනාධිපතිතුමා ඇතුළු සම්භාවනීය පිරිස ජාතික එකතුවට පිවිසෙමින්



ජනාධිපතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා සහ සංස්කෘතික හා ප්‍රවෘත්ති ඇමතිතුමා ජාතික එකතුව පරීක්ෂා කරමින්

විවෘත කිරීමේ උළෙලට සහභාගිවූ සම්භාවනීය අමුත්තන්

ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය
ලලින් ඇතුලත්මුදලි මැතිතුමා
උත්සව සභාව අමතමින්

අතිගරු ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මැතිතුමා
උත්සව සභාව අමතමින්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ
සභාපති ඊශ්වරී කොරයා මහත්මිය
උත්සව සභාව අමතමින්

ගරු අධ්‍යාපන සේවා ඇමතිනී
සුනේත්‍රා රණසිංහ මැතිනිය
උත්සව සභාව අමතමින්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රථම අධ්‍යක්ෂ
එම්. එස්. යූ. අමරසිරි මහතා ජනාධිපතිතුමා වෙත
සමරු ඵලකය හා සමරු ග්‍රන්ථය පිළිගන්වමින්

අපගේ සමස්ත කාර්ය මණ්ඩලය
විවෘත කිරීමේ උත්සවයට සහභාගි වෙමින්

විවෘත කිරීමේ උළෙල අවසන පැවති
සංස්කෘතික සංදර්ශනයේ එක් අවස්ථාවක්

බුද්ධමන් වීරකෝන් මහතා සහ එච්. එස්. වනසිංහ මහතා
ජාතික පුස්තකාලයේ මුල්ම සාමාජිකයින්
දෙපල වීමේ භාග්‍ය උදාකරගන්න.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීමේ උත්සවයේ දී

ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති ඊශ්වරී කොරයා මැතිතුමිය පවත්වනු ලැබූ කථාව

ගරුතර මහා සංඝරත්නය ඇතුළු පූජ්‍ය පක්ෂයෙන් අවසර යි.
ශ්‍රීමත් ජනාධිපතිතුමනි,
ගරු අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය
ලලිත් ඇතුලත්මුදලි මැතිතුමනි,
ගරු අධ්‍යාපන සේවා අමාත්‍ය සුනේත්‍රා රණසිංහ මැනිනියනි,
ගරු සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍ය
වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමනි,
ගරු ඇමතිවරුනි,
විදේශීය තානාපතිවරුනි,
මහකොමසාරිස්වරුනි, සම්භාවනීය අමුත්තනි.

මේ සන්ධ්‍යාවේ ඔබ සියළු දෙනාම පෞද්ගලිකවත්, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙනුවෙනුත් පිළිගැනීමට ලැබීම මාගේ භාග්‍යයක් යැයි මම සිතමි. ප්‍රථමයෙන්ම මෙම ජාතික උත්සවයට සහභාගිවීම පිළිබඳව බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සහ මුස්ලිම් පූජකතුමන්ලාට මාගේ නමස්කාර පූර්වක ස්තුතිය පිරි නමමි.

ශ්‍රීමත් ජනාධිපතිතුමනි, ඔබ තුමාගේ කාර්‍ය බහුල වැඩ සටහන්වලින් විවේකයක් ලබා ගෙන **ජාතික පුස්තකාලය විවෘත** කිරීමේ උත්සවයට සහභාගිවීමට පැමිණීම ගැන **ඔබ තුමාට** අපගේ ප්‍රණාමය පුද කරමි.

ගරු අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ඇමතිතුමනි, මෙම උත්සවයට පැමිණීම පිළිබඳව අපි ඔබතුමාට අතිශයින් කෘතඥ වෙමු. මෙම උත්සවයට සහභාගිවීම පිණිස පැමිණි ගරු අධ්‍යාපන සේවා ඇමතිතුමියට ද අතිශයින් කෘතඥ වෙමු. තව ද, ඔබ තුමිය විසින් දෙන ලද උපදෙස් අපි ඉතා අගය කොට සලකමු. පසු ගිය වසර තුළ අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ සංස්කෘතික කටයුතු හා ප්‍රවෘත්ති අමාත්‍ය ගරු වි. ජ. මු. ලොකුබණ්ඩාර මැතිතුමාටත් අපගේ ගෞරවය අපි පිරිනමමු.

අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා, අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අනෙකුත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා රාජ්‍ය ලේකම්වරුන් ද, නිලධාරීන් ද කෘතඥතා පූර්වකව පිළිගනිමි. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපතිනිය ඇතුළු පුස්තකාල විද්‍යා ක්ෂේත්‍රයේ මාගේ සහෝදර පුස්තකාලයාධිපතිවරුන්ට ද, විශේෂයෙන්ම මේ අවස්ථාවට සහභාගි වන මාලදිවයිනේ ජාතික පුස්තකාලයේ අධ්‍යක්ෂවරිය හා ඕස්ට්‍රේලියාවේ ජාතික පුස්තකාලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ද ස්තුතිපූර්වකව පිළිගනිමි. 1990 වසරේ අප්‍රේල් මස 27 වැනි දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම නිසා මේ දින ඓතිහාසික වශයෙන් වැදගත් දිනයක් වනු ඇත. ශ්‍රීමත් ජනාධිපතිතුමනි, ඔබ තුමා නිරන්තරයෙන්ම පුස්තකාල කටයුතු හා පුස්තකාල වෘත්තියේ අභිවෘද්ධිය පිළිබඳව දක්වන උනන්දුවත්, මෙම පුස්තකාල ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු ඉක්මන් කරලීමට ඔබ තුමා ගත් පෞද්ගලික උත්සාහයත් නිසා ඔබ තුමා විසින් ම මෙම පුස්තකාලය විවෘත කිරීම ඉතාමත්ම යෝග්‍ය බව කාගේත් විශ්වාසය යි. මේ පිළිබඳව ඔබ තුමාට, අධ්‍යාපන හා සංස්කෘතික ක්ෂේත්‍රයේ සෑම දෙනාගේම ප්‍රණාමය නිමි විය යුතුය.

ශ්‍රී ලංකාවට ජාතික පුස්තකාලයක අවශ්‍යතාවය, විද්වතුන්, පුස්තකාලයාධිපතීන් සහ රජය විසින් වසර ගණනාවක සිට දක්වා ඇති කරුණකි. එසේ වුව ද ජාතික පුස්තකාලයක් සහ ජාතික පුස්තකාල පද්ධතියක් පිහිටුවීමේ මූලික පදනම දමන ලද්දේ, 1967 කොළඹ දී පවත්වන ලද යුනෙස්කෝ ජාතික පුස්තකාල සම්මේලනයේ ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව 1970 අංක 17 දරණ පනත මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී. එම පනත අනුව ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පිහිටුවීම සහ පවත්වා ගෙන යාම ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මූලික වගකීමක් වේ.

ඕනෑම රටක ජාතික පුස්තකාලය කේන්ද්‍රකොට ගෙන ඒ රටේ පුස්තකාල හා තොරතුරු අවශ්‍යතා පවතී. එය රටේ සෑම අංශයකට ම, සෑම පුද්ගලයකුට ම සේවය සපයන බහු කාර්‍ය ආයතනයක් බව කිව යුතු ය. එය තොරතුරු එකතු කරන සහ තොරතුරු ප්‍රචාරණය කරන මධ්‍යස්ථානය වශයෙන් ද කටයුතු කෙරේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ මූලික පරමාර්ථයක් වනුයේ, ජාතියේ ප්‍රකාශන එකතු කිරීම, ජාතියේ සංස්කෘතික සහ කලාත්මක සහ ජනතාවගේ සාහිත්‍යමය උරුමයට අත දීම වේ. මහජනතාවටත්, පර්‍යේෂණ කටයුතු සැලසුම් සකස් කිරීමේ දී හා ප්‍රතිපත්ති සම්පාදනයේ දී අවශ්‍ය වන සියළුම තොරතුරු ලබා දීමත් ජාතික පුස්තකාලයක මූලික කාර්‍යයන් වේ. තව ද, හැකි සෑම පුස්තකාල සම්පතක් ම අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා එක් රැස් කර සුරක්ෂිතව තැන්පත් කළ යුතු ය.

මෙම ජාතික පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය අවසන් කිරීමෙන් සියළු කටයුතු අවසාන වූවා යැයි සිතා විවේක ගැනීමට අවකාශයක් නැත. අපගේ නියම කාර්‍යයන් හා වගකීම් ද ආරම්භ වන්නේ මෙතැන් සිට යි. ජාතික පුස්තකාල කටයුතු හොඳින් ඉටු කර ගෙන යාමටත්, පුස්තකාල සේවාවන් අවශ්‍යතාවයන් අනුව වෙනස් කරලීමටත්, අළුත් කාර්‍යයන් අපගේ සේවාවලට ඇතුළත් කිරීමටත්, ඇතැම් සේවාවන් සම්පූර්ණයෙන් ම ඉවත් කරලීමටත් සිදු වනු ඇත. මේ අනුව ජාතික පුස්තකාලය සඳහා නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමට ද සිදු වනු ඇත. මේ අවස්ථාවේ දී පොත්පත් ආදී පුස්තකාල සම්පත් පරිත්‍යාග කළ සියලු දෙනාටත්, විශේෂයෙන් ම නැසී ගිය මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ පවුලේ හැමටත් මම ඉතාමත් ම ස්තුතිවන්ත වෙමි.

අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්. බී. ඩී. පීරිස් මහතාට ද අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ ලේකම් එච්. ඒ. විමලගුණවර්ධන මහතාට ද, අප වෙත දක්වන ලද සහයෝගය අතිශයින් ස්තුති වන්ත වෙමි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කරලීම සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වැඩ බලන අධ්‍යක්ෂ එම්. එස්. යූ. අමරසිරි මහතා ඉටු කළ විශාල කායී භාරය පිළිබඳව මම අතිශයින් කෘතඥ වෙමි. මේ කායීයේ දී ඉතාමත් උනන්දුවෙන් සහ ඇප කැපවීමෙන් කටයුතු කළ පුස්තකාල සේවා මණ්ඩලයේ කායී මණ්ඩලයට ම මම අතිශයින් ස්තුතිවන්ත වෙමි.

මෙම කායීයේ දී අප හට නන් අයුරින් සහාය වූ සියළු දෙනාට ම මම අතිශයින් කෘතඥ වන අතර, ඔවුන් සියළු දෙනා ම ආදරයෙන් පිළි ගනිමි. එසේම මේ අවස්ථාවේ දී ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පාඨකයින්ට භාර බව මතක් කළ යුතු ය. මක් නිසා ද? පාඨකයන්ගේ සහාය නොමැතිව පුස්තකාලයේ පරමාර්ථ ඉටු කර ගත නොහැකි බැවිනි. එසේම මා හට නිතරම අවවාද අනුශාසනා කරන ගරුතර මහා සංඝයා වහන්සේ සහ අනෙකුත් ආගමික නායකවරුන්ට නැවත වරක් මාගේ කෘතඥතාවය මම පිරි නමමි.

Ven. Maha Sanga, Rev. Sirs, Your Excellency, Hon. Lalith Athulathmudali, Minister of Education & Higher Education, Hon. Mrs. Sunethra Ranasinghe, Minister of Education Services, Hon. W. J. M. Lokubandara, Minister of Cultural Affairs & Information, Honourable Ministers, Members of the Diplomatic Corp and Distinguished Guests.

It gives me great pleasure to welcome each and everyone of you here this evening on my own behalf and on behalf of the Sri Lanka National Library Services Board on the occasion of the ceremonial opening of the National Library, by H. E., the President.

First of all I wish to pay my humble homage to the very reverend members of the Buddhist, Hindu and Christian clergy and to the venerable Alim for being with us this evening.

I extend a very welcome to Excellency for taking time off, a very busy schedule as the executive President, of our country to be present on this occasion.

Hon. Minister of Education & Higher Education and, the Hon. Minister of Education Services, I thank you both most sincerely, for coming here today. My thanks, also go to the Hon. Minister of Education Services for her guidance and advice. My grateful thanks also go to the Hon. W. J. M. Lokubandara, Minister of Cultural Affairs & Information under whom, we worked the last year, for being present, here with us this worked the last year, for being present, here with us this evening. It is a pleasure to welcome the Secretary of the Ministry of Education and Higher Education, the Secretary of the Ministry of Education Services and the other Secretaries and State Secretries and Officials here this evening.

I extend a warm and sincere welcome to the President of the Sri Lanka Library Association and to my colleagues in the Library Profession. I am very grateful to the Director of the National Library of the Maldives and the Addl. Director General of the National Library of Australia, for having come here specially to be with us during this ceremonial opening.

Today, the 27 th of April 1990 can be said to be a very auspicious and historic day for our country as the National Library has now become a reality. It is both just and appropriate that, it is Your Excellency who has declared open this Library today, as you have always taken, an abiding and active interest in Libraries and the promotion of the Library Profession. If not per your personal involvment during the latter stage of the construction of this building, it may not have been possible to inaugurate the National Library this evening.

Your Excellency, all those interested in Reading, Education and Culture owed great debt of aptitude to you. The need, for a National Library was keenly felt by Scholars, Librarians and the Government for a very long period. It was however, in 1967, after the UNESCO Conference held in Colombo, that a decision was taken for the establishment of a National Library and a National Library system. As a result, the Sri Lanka National Library Services Board was set up in 1970 by Act No. 17, and one of its functions is the establishment and maintenance of the National Library of Sri Lanka.

A National Library of any country is the centre round which the full Information and Library needs rotate. It is a multifaceted institution with its services reaching out to every corner of the country and to every individual. It will be the focal point for the collection of informations and its dissemination.

One of the prime objectives of the National Library is to collect, the nation's literature and safeguard the cultural, artistic and literary heritage of the people.

It is also binding on the National Library to retain and preserve for posterity and make available. all information needed, for research, planning and policy making.

I like to mention here that the completion, of the ceremonial opening of the National Library would not mean, that we could sit back and relax. Our real responsibilities and tasks will begin only now. We will have to tread warily, adjusting the services as we go on, adding functions to those already planned or perhaps changing some of the functions completely. New legislation too may have to be enacted.

I like to take this opportunity to thank the late Mr, Martin Wickremasinghe's family and those other persons, who have donated collections of books and other library materials to the National Library.

I also wish to thank Mr. M. D. D. Peiris, the Secretary of the Ministry of Education & Higher Education and Mr. H. A. Wimalagunawardene, the Secretary of the Ministry of Education Services for their assistance.

I am indeed very grateful, to Mr. M. S. U. Amarasiri, the Acting Director of the Sri Lanka National Services Board, who, with his efficiency, has helped to make the opening of the National Library possible. I must also thank the staff of the Board for their dedicated work.

My sincere thanks go to all those others who have. by their assistance and participation helped us in numerous ways. I wish also to dedicate this library to the users without whose participation this institution cannot be fully functional.

I should not forget to acknowledge the deep debt of gratitude I owe to the Maha Sangha and other religious leaders for their advice to me at all times. Thank you.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ සාමාජිකත්වය ලබාගැනීම සහ ඉන් සැලසෙන සේවා

1. **පාඨකයින් බඳවා ගැනීම සහ පාඨක ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම:**

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය පර්යේෂණ සහ විමර්ශන පුස්තකාලයක් වන බැවින්, පර්යේෂකයින් පාඨකයින් වශයෙන් බඳවා ගැනීමට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබති. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි සාමාජිකයෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා සහ පාඨක ප්‍රවේශ පත්‍රයක් ලබාගැනීම පිණිස අදාල **ඉල්ලුම් පත්‍ර ජාතික පුස්තකාලයෙහි පාඨක සේවා අංශයේ ප්‍රධාන කවුන්ටරය වෙතින් ලබාගෙන** එය නිවැරදිව පුරවා ජාතික පුස්තකාලයේ පාඨක සේවා අංශයේ ප්‍රධානියා වෙත **ඉදිරිපත්** කළ **යුතුවේ.**

යටත් පිරිසෙයින් දින තුනකට කලින්වත් තම ඉල්ලුම් පත්‍රය එවිය යුතුවේ. සෑම ඉල්ලුම් පත්‍රයකම ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ පුස්තකාල ද්‍රව්‍ය පරිහරණය කිරීමට ඉල්ලුම් කරුට ඇති යෝග්‍යතාවයත්, ඉල්ලුම් පත්‍රයේ ඇති ප්‍රකාශයන් පිළිබඳ නිරවද්‍යතාවයත් අදාල විශ්ව විද්‍යාලයේ වගකිව යුතු නිලධාරියකුගේ හෝ අදාල ජ්‍යෙෂ්ඨ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විසින් හෝ අදාල රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක ප්‍රධානියෙක් හෝ පිළිගත් විද්වතෙකු විසින් සහතික කළ යුතුවේ.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි නීතිරීති හා කොන්දේසිවලට අනුකූලව මෙම පුස්තකාලයේ කියවීම් ශාලාව සහ පුස්තකාලීය පොත් පත් පරිහරණය කිරීමට ඉඩදෙනු ලැබේ. එක් ලිත් වර්ෂයක් සඳහා දිගු කාලීන ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලබන අතර, ලිත් වර්ෂයකට අඩු කාල සීමාවන් සඳහා කෙටිකාලීන ප්‍රවේශ පත්‍ර නිකුත් කෙරේ. මේවා තාවකාලික ප්‍රවේශ පත්‍රවේ.

2.ලියාපදිංචි කිරීමේ ගාස්තු:

පාඨකයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු පහත සඳහන් පරිදි වේ:–

ලිත් වර්ෂයකට	රු. 100.00
මාස හයක් සඳහා	රු. 50.00
මාස තුනක් සඳහා	රු. 25.00
මාස තුනකට අඩු කාලයක් සඳහා	රු. 15.00

3 **ඡායාරූප පිටපත් සේවය:**

ඡායාරූප හෝ ඡායාස්ථිති පිටපත් ලබා ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා ඊට නියමිත ආකෘති පත්‍රය සම්පූර්ණ කර ඒ මගින් ඉල්ලුම් කළ යුතු වේ. ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විශේෂ සහන මිලකට ඡායා පිටපත් ලබා ගැනීමට කටයුතු පිළියෙල කර ඇති අතර, අදාල ඡායා පිටපත් ලබාගැනීම-ඡායාරූප පිටපත් සේවා ඇණවුම් පතෙහි සඳහන් කොන්දේසිවලට යටත් වේ. අදාල මිල ගණන් පාඨක සේවා අංශයන්හි කවුන්ටරවලින් ලබාගත හැකිය.

4. **විමසීම් සේවය:**

ලිපි මගින් හෝ දුරකථනය මගින් හෝ පෞද්ගලිකව හෝ පුස්තකාලයීය ද්‍රව්‍ය පිළිබඳව හා කිසියම් තොරතුරක් පිළිබඳව කරන විමසිම්වලට පිළිතුරු සැපයේ.

5. **යොමුගත සේවය:**

කිසියම් පාඨකයෙකුට අවශ්‍ය පොතක් හෝ වෙනත් පුස්තකාල ද්‍රව්‍යයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල එකතුවෙහි නොමැති විට දී ඒ පොත හෝ ද්‍රව්‍ය ලබාගත හැකි පුස්තකාලය වෙත එකී පාඨකයා යොමු කරලීමේ යොමු ගත සේවාවක් ජාතික පුස්තකාලයෙහි ඇත.

6. **ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘතව පවතින දිනයන් සහ වේලාවන්:**

ඉරිදා, සඳුදා සහ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හැර අන් සෑම දිනකම පෙරවරු 9.00 සිට පස්වරු 5.00 දක්වා පුස්තකාලය පාඨකයින් සඳහා විවෘතව ඇත.

පුවත් ලුහුඬින්

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය හා සූචිකරණ අංශය

පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය

1962 නොවැම්බර් සිට මේ දක්වා ලංකාවේ මුද්‍රණය කරන ලද පොත් පත් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ඇතුලත් වේ. එහෙත් ලංකාවේ මුද්‍රණ ශිල්පය ආරම්භයේ සිට 1962 සැප්තැම්බර් මස දක්වා පළවූ පොත් පත් පිළිබඳ සාධිකාරී ලේඛනයක් නොවීම මෙරට ග්‍රන්ථ විග්‍රහ පාලනයේ පවත්නා විශාල අඩුපාඩුවකි. ඒ අනුව වර්ෂ 1885 මුද්‍රණ ශිල්පීන් හා ප්‍රකාශකයන්ගේ ආඥා පනත යටතේ දැනට රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව භාරයේ පවත්නා නීත්‍යානුකූල තැන්පත් පදනම් කරගෙන පූර්වකාලීන ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කිරීමට ග්‍රන්ථවිද්‍යාත්මක තොරතුරු රැස්කිරීමේ මූලික කටයුතු ආරම්භ කර ඇත. 1990 වර්ෂය තුල 1962 ජනවාරි සිට සැප්තැම්බර් අතර කාලය තුළ පළවූ පොත් පත් පිළිබඳ තොරතුරු ආශ්‍රිතව පූර්ව කාලීන ග්‍රන්ථ නාමාවලියේ මුල් කලාපය පළ කිරීමට බලාපොරොත්තු වේ.

සමාජ විද්‍යා ප්‍රලේඛන මධ්‍යස්ථානය

* ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යා පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථාන පිළිබඳ 1987–1990 නාමාවලිය සකස් වෙමින් පවති.
* 1987–1990 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ පැවති සම්මන්ත්‍රණ පිළිබඳ අනුක්‍රමණිකාව සම්පාදනය වෙමින් පවති.
* ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාඥයන්ගේ තොරතුරු සංග්‍රහයක් සකස් කිරීමේ මූලික වැඩ කටයුතු අවසන් වෙමින් පවති.

පශ්චාත් උපාධි පර්යේෂණ නිබන්ධන හා වාර සඟරා අනුක්‍රමණිකා

1980 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙළේ අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාල සතුව පවත්නා පර්යේෂණ නිබන්ධන හා වාර සඟරා පිළිබඳ තොරතුරු ප්‍රලේඛනය කිරීම සඳහා ග්‍රන්ථ විඥපන සේවා අංශය විසින් කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා දැනට විශ්ව විද්‍යාල හා වෙනත් පර්යේෂණ පුස්තකාලවලින් තොරතුරු ලැබී ඇති අතර ආයතන වලින් තොරතුරු ලබාගැනීම සඳහා කටයුතු කරගෙන යනු ලැබේ. මෙම තොරතුරු ඉංග්‍රීසි අකාරාදීව අනුක්‍රමණිකා කෙරෙනු ඇත.

පුස්තකාල අධ්‍යාපන හා පුහුණු අංශය

පාසැල් ගුරු පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම 1990 ජනවාරි–ජූනි

* 1990.03.12–16 දින දක්වා මහනුවර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ගුරු භවතුන් 37 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මහනුවර ඊ. එල්. සේනානායක ළමා පුස්තකාලයේ දී පස් දින පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
* 1990.05.18 – 22 දින දක්වා මාතර අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ගුරු භවතුන් 60 දෙනෙකුගේ සහභාගිත්වයෙන් මාතර සුජාතා බාලිකා විද්‍යාලයේ දී පස් දින පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
* 1990.05.29 සිට 1990.06.01 දින දක්වා කුලියාපිටිය අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ගුරු භවතුන් 57 දෙනෙකුගේ සහභාගිත්වයෙන් කුලියාපිටිය අධ්‍යාපන කාර්යාලීය ප්‍රධාන ශාලාවේ දී සිව් දින පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
* 1990.06.13 – 16 දින දක්වා ගාල්ල අධ්‍යාපන දිස්ත්‍රික්කයේ ගුරු භවතුන් 40 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ගාල්ල සවුත්ලන්ඩ්ස් බාලිකා මහා විද්‍යාලයේ දී සිව් දින පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.

ජාතික පුස්තකාලය පිළිබඳ සම්මන්ත්‍රණ

ජාතික පුස්තකාලය විවෘත කිරීම නිමිත්තෙන් 'ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ කාර්ය භාරය' මැයෙන් සම්මන්ත්‍රණ 04 ක් ජාතික පුස්තකාල ගොඩනැගිල්ලේ දී පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණ මාලාව සඳහා, විශ්ව විද්‍යාල, විශේෂ, කාර්මික විද්‍යාල, මහජන, ගුරු විදුහල්, පාසැල් සහ පිරිවෙන් පුස්තකාලයන්හි පුස්තකාලයාධිපතිවරු 200 ක් පමණ සහභාගි විය.



* එහි පළමු සම්මන්ත්‍රණය 1990.03.09 වන දින පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති එන්. ටී. එස්. ඒ. සේනාධීර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

* 1990.03.16 දින සම්මන්ත්‍රණය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පුස්තකාලයාධිපති ඩබ්ලිව්. බී. දොරකුඹුර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

* 1990.03.23 දින සම්මන්ත්‍රණය අන්තර් ජාතික වාරිමාර්ග කළමනාකාරිත්ව ආයතනයේ පුස්තකාලයාධිපති එන්. යූ. යාපා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

* 1990.03.29 දින සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනයේ විඥාපන අංශයේ අංශ ප්‍රධාන සි. එල්. එම්. නෙත්සිංහ මෙනවියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ජාතික පුස්තකාල දේශන මාලා

'ජාතික පුස්තකාල දේශන මාලා'මැයෙන් 1990 ජූනි මස ආරම්භ කරන ලද මාසික දේශන මාලාවේ ප්‍රථම දේශනය

ආචාර්ය ගාමිණී කොරයා මහතා විසින් 1990 ජූනි මස 26 දින ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වූ මෙම දේශනයේ මාතෘකාව වූයේ Development perspective in the 1990S.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම නිමිත්තෙන් ප්‍රාදේශීය මට්ටමේ උත්සව පැවැත්වීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම වෙනුවෙන් ගාල්ල මීගමුව, බදුල්ල, නුවරඑළිය, බලන්ගොඩ, හැටන්, කඩුගන්නාව, යන නගර සභා ආශ්‍රිත මහජන පුස්තකාලයන්හි සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන පවත්වන ලදී.

සංවර්ධන හා පර්යේෂණ අංශය

පළාත් සභා පුස්තකාල සංවර්ධන ව්‍යාපෘතිය:

විමධ්‍යගත පරිපාලන ක්‍රමය යටතේ පළාත් සභා මට්ටමින් ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධනය කිරීමේ අරමුණින් ඌව පළාත සඳහා පුස්තකාල සංවර්ධන නියාමක ව්‍යාපෘතියක් ආරම්භකර ඇත. මෙවැනි ව්‍යාපෘතියක් සඳහා උතුරු මැද පළාත් සභාව සමඟද මූලික මට්ටමේ සාකච්ඡා පැවැත්වෙමින් පවතී.

මහජන හා ස්වේච්ඡා සංවිධාන පුස්තකාල උපදේශක සේවා:

මීරිගම ඩී. එස්. සේනානායක අනුස්මරණ පුස්තකාලය පිහිටුවීම සඳහා මූලික උපදෙස් ලබාදීම.
බණ්ඩාරගම හා මහරගම මහජන පුස්තකාලයට අවශ්‍ය උපදෙස් ලබාදීම. අංගොඩවත්ත මසාකෝ නිසිමොනෝ අනුස්මරණ පුස්තකාලය පිහිටුවීම හා පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
පුස්තකාල ගොඩනැගිලි සඳහා සැලසුම් සටහන් ලබාදීම. ශ්‍රී ලංකා පදනම් ආයතන පුස්තකාලය හා කම්කරු දෙපාර්තමේන්තු පුස්තකාලය සඳහා වෘත්තිමය උපදෙස් ලබා දීම.

ජාතික නිර්දේශක මධ්‍යස්ථානයට ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු රැස් කිරීම:

රාජකීය ආසියාතික සංගමයේ ලංකා ශාඛා පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලයේ ශ්‍රී ලංකා ග්‍රන්ථ එකතුව, කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පුස්තකාලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ ග්‍රන්ථනාමාවලී හා අනුක්‍රමණිකා සඳහා, ග්‍රන්ථවිද්‍යාත්මක තොරතුරු රැස් කිරීම සිදුකර ඇත.

ප්‍රදර්ශන සහ පොත් අලෙවි සල් පැවැත්වීම:

* 1990.01.20, 21 දෙදින තුළ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ දී 1990 පාසල් පොත් බෙදාදීමේ ජාතික උත්සවය වෙනුවෙන් මණ්ඩලීය කටයුතු පිළිබඳව ප්‍රදර්ශනයක්, පොත් අලෙවි සලක් සමඟ සම්මන්ත්‍රණ මාලාවක් පැවැත්විණි.

* 1990.02.17, 18 දෙදින තුළ පොළොන්නරුව රාජකීය මධ්‍ය මහා විද්‍යාලයේ දී පැවති ප්‍රඥා දීපනී අධ්‍යාපන වැඩ සටහන නිමිත්තෙන් පොත් අලෙවි සලක් පැවැත්විණි.

* 1990.03.25 සිට 1990.04.04 දක්වා බණ්ඩාරගම මධ්‍ය මහා විද්‍යාලයේ නව වන මහපොළ සංවත්සරික උළෙල නිමිත්තෙන් පොත් අලෙවි සලක් හා ප්‍රදර්ශනයක් පැවැත්විණි.

* 1990.04.27 දින ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය විවෘත කිරීම නිමිත්තෙන් පොත් ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ දී පැවැත්විණි.

* 1990.06.23 සිට 1990.07.03 දක්වා පල්ලෙකැලේ ගම්උදා ප්‍රදර්ශන භූමියේ දී පොත් අලෙවි සලක් පැවැත්විණි.

ජාතික පුස්තකාලයේ පොත් අලෙවි සල විවෘත කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අනුග්‍රහයෙන් ප්‍රකාශිත ග්‍රන්ථ, මණ්ඩලය විසින් මිල දී ගනු ලබන මුද්‍රිත ග්‍රන්ථ සහ පුස්තකාල සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය අලෙවි සල ගරු අධ්‍යාපන සේවා ඇමතිනී සුනේත්‍රා රණසිංහ මැතිනිය අතින්, 1990.06.01 දින ජාතික පුස්තකාල භූමියේ දී විවෘත කරන ලදී.

* සියලුම පුස්තකාල සඳහා විශේෂ අඩු මිලකට පොත් සහ පුස්තකාල ලිපි ද්‍රව්‍ය මෙහි දී ලබාගත හැක.

* සාමාන්‍ය පාඨකයින් සඳහා ද විශේෂ සහන මිලකට පොත් මිල දී ගත හැක:

* කාර්යාල දිනයන්හි පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා මහජනයා සඳහා විවෘතව පවතී.

ඉදිරියේ දී එළි දකින ප්‍රකාශන

පිරිවෙන් පුස්තකාල තොරතුරු සංග්‍රහය

* ලංකාවේ සියලුම පිරිවෙන් පුස්තකාල සමීක්ෂණය කොට ලබාගන්නා ලද වැදගත් තොරතුරු ආශ්‍රයෙන් සම්පාදනය කෙරේ.

* පාසැල් පුස්තකාල සඳහා සුදුසු විමර්ශන පොත් ලැයිස්තුවක් සම්පාදනය කර ඇත.

පාඨක සේවා අංශය:

1990 අප්‍රියෙල් මස 27 වෙනි දින ජාතික පුස්තකාලය විවෘත කළ අතර, 1990.04.28 වෙනි දින සිටම පාඨක සේවා අංශය නම් සේවා සැපයීම ආරම්භ කරන ලදී.

ජාතික පුස්තකාලයට පාඨකයින් බඳවා ගැනීමේ ව්‍යාපෘතිය යටතේ පාඨකයින් හඳුනාගැනීම සහ ජාතික පුස්තකාලයේ සම්පත් මෙන්ම සේවාවන් පිළිබඳ තොරතුරු ද සපයා සාමාජික ඉල්ලුම්පත් ලබාදීම අරඹන ලදී. පළමු පියවරේ දී විශ්ව විද්‍යාලයන්හි ආචාර්ය වරුන් වෙනත්, දෙවැනි පියවරේදී අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩලයන්හි පර්යේෂණවල නියැලී සිටින නිලධාරීන් වෙනත් සාමාජිකත්වය ලබා ගැනීමට මූලික කටයුතු ඉටු කර ඇත.

අන්ධ සහ දෘශ්‍යාබාධිත අය සඳහා පුස්තකාල සේවා:

ජාතික පුස්තකාලයේ පාඨක සේවාවන්හි අඩු අංශයක් වන ආබාධිතයන් සඳහා පුස්තකාල සේවා සැලසීමේ අංශය අන්ධ සහ දෘශ්‍යාබාධිතයන් සඳහා ව්‍යාපෘතියක් දියත් කර ඇත.

දිවයින පුරා අන්ධ ළමුන් ඉගෙනුම ලබන පාසැල් සහ අන්ධ සහ දෘශ්‍යාබාධිතයන් සඳහා සේවා සලසන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සංවිධාන වෙතින් තොරතුරු ලබාගැනීම ආරම්භ කර ඇත.

පරිගණක ඒකකය:

ජාතික පුස්තකාලයේ පහත සඳහන් ක්ෂේත්‍ර පරිගණක ගත කිරීම ආරම්භ කර ඇත.

1. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය.
2. පුස්තකාල ද්‍රව්‍ය ප්‍රතිග්‍රහණය කිරීම හා අදාල කාර්යයන්
3. ජාතික පුස්තකාල එකතුව
4. ඒකාබද්ධ සුචිය
5. සමාජ විද්‍යා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කාර්යයන්
6. අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ අංක ව්‍යාපෘතිය.

ජාතික පුස්තකාල එකතුවට අයත් පුස්තකාල විද්‍යාව හා විඥපන විද්‍යා එකතුව පරිගණක ගත කිරීමේ කාර්යය අවසන් කර ඇත.

ජාත්‍යන්තර හුවමාරුව:

ජාත්‍යන්තර හුවමාරු යටතේ දකුණු ආසියා කලාපීය සහයෝගීතාව (සාර්ක්) ට අයත් රටවල් ද, පීජී සහ පැපුවානිව්-ගිනි යන රටවල් ද දැන් අලුතින් එකතුවී ඇත. මේ අනුව දැනට හුවමාරු වැඩ පිළිවෙලට අයත් පුස්තකාල සංඛ්‍යාව 32 වේ.

විදේශ චාරිකා

1990 ජනවාරි 13-14 දක්වා ඉන්දියාවේ කොට්ටායන් හි පැවති ජාතාන්තර පොත් ප්‍රදර්ශනය සඳහා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ශ්‍රී ලංකාව නියෝජනය කරන ලදී. ඉන්දියාව සහ විදේශීය පොත් ප්‍රකාශකයින් 200 ට අධික සංඛ්‍යාවක් ප්‍රදර්ශනයට සහභාගි වූ අතර හොඳම ඉංග්‍රීසි පොත් ප්‍රදර්ශන කුටිය වෙනුවෙන් ප්‍රදානය කරනු ලැබූ සම්මානය ශ්‍රී ලංකාව නියෝජනය කරන ලද ආයතන දෙක වෙත පිරිනමන ලදී. ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ ලේකම් නිලමනී අබේරත්න මහත්මිය සහ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂිකා නාලිනී ද සිල්වා මහත්මිය මේ සඳහා සහභාගිවූහ.

යුනෙස්කෝ සංවිධානයේ අනුග්‍රහයෙන් 1990 පෙබරවාරි 16 සිට 28 දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර සමාජ විද්‍යා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ පැවති ''දත්ත මධ්‍යස්ථාන පරිගණක'' කෙටි කාලීන පාඨමාලාව ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂ එච්. එම්. ගුණරත්න බණ්ඩා මහතා සහභාගි විය. මෙම චාරිකාවේ දී ඔහුගේ සංචාරයට හසු වූ ස්ථාන අතර ඉන්දියානු විද්‍යා හා තාක්ෂණ පුස්තකාලය **(INSDOC)** ශ්‍රී ජවහාර් ලාල් නේරු අනුස්මරණ පර්යේෂණ පුස්තකාලය, ජාතික වෛද්‍ය ප්‍රලේඛන මධ්‍යස්ථානය හා දිල්ලි විශ්ව විද්‍යාලයීය පුස්තකාලය ද වැදගත් වේ.

පොත් ප්‍රකාශන ආධාර වැඩපිළිවෙල

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් ප්‍රකාශන ආධාර වැඩ පිළිවෙල අනුග්‍රහයෙන් පහත සඳහන් කෘතීන් 1990 ජනවාරි සිට ජූනි දක්වා පළ කර ඇත.

විෂය	කර්තෘ	ග්‍රන්ථ නාමය
අධ්‍යාපන	හෙන්රි වීරසිංහ	බුද්ධාගම ඉගැන්වීමේ මූලධර්ම
ජනකතා	සරත් කරුණානායක	එතෙර මෙතෙර හාවාගේ ජන කතා
භාෂාව	මුනිදාස සෙනරත් යාපා	මේ සිංහල අපගේ බසයි
	ආචාර්ය රත්න විජේතුංග	හෙළ වහර හා සන්නිවේදනය
සංගීතය	ආනන්ද ජයසිංහ	නැළවිලි ගී
සාහිත්‍යය	පියදාස රණසිංහ	චීන උපහාස කතා
චරිත කතා	අ. දොං. චන්ද්‍රසේකර	කිවිසුරු සිරිත
	ථීරෝන් ප්‍රනාන්දු	රැව් පිළිරැව්
නවකතා	ආර්. එල්. වීරරත්න	සිවු මිතුරන් සහ යුරේනියම් කන්ද
	තිලක නවරත්න	හිතලුගේ චාරිකාව
	දොං. ඩ. ඩයස්	ගුරු ගෙදරක කතාවක්
	ටී. බී. ඉලංගරත්න	අසිත සහ විනීතා
	කේ. ජී. කරුණාසේන	මතුමහලට හිරිකඩක්
	රංජිත් ධර්මකීර්ති	අහස පොළොව ලංවෙලා
	කේ. පී. නිහාල්නන්ද	ගම මැදින් ගහ ගලා
කෙටි කතා	දයාසේන ගුණසිංහ	කේතුමතී හෝටලයේ රාත්‍රියක්
	සුනිල් ජේ. සේමසිංහ	සිහින දකින මිනිස්සු
	කේ. ජී. ප්‍රේමරත්න	ලේ සහ කඳුළු
පරි. කෙටිකතා	බොබී. ජී. බොතේජු	මල්ලවපොරය සහ තවත් ඉන්දියානු කෙටි කතා
නාට්‍ය	කුලතිලක කුමාරසිංහ	පුෂ්කදෙන්
	සුනන්ද මහේන්ද්‍ර	සොක්‍රටීස් නාටකය
පරි. නාට්‍යය	පී. වැලිකල	ගිනි පුපුරු
	Jean Jacanes Bernard	Sulky fire
පද්‍ය	ශාන්ත වීරවර්ධන	විරෝධය
	රංජිත් මල්ලියාවඩු	ඇස් ලැබීම

ඉහත සඳහන් සියලුම කෘති 15% විශේෂ වෙළඳ වට්ටම් යටතේ මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල හා සුභ සාධක පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන් මිලදී ගත හැකිය.

පුස්තකාල විද්‍යාර්ථීන්ගේ දැනුම වඩන ප්‍රකාශන



කර්තෘ: ආචාර්ය කේ. ඩී. ජී. විමලරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

"පොත් පත් ස්වභාවික ආපදාවන්ගෙන්, කෘමීන්ගෙන් සහ වෙනත් ආපදාවන්ගෙන් ආරක්ෂා කර ගැනීම පුස්තකාලයාධිපති මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වී ඇත. මෙම විෂය ක්ෂේත්‍රයට අදාල නවතම තොරතුරු ඇතුලත් වන මෙම ග්‍රන්ථයෙන් පුස්තකාල ද්‍රව්‍ය සංරක්ෂණය සහ ප්‍රතිසංස්කරණය පිළිබඳ පැහැදිලි අවබෝධයක් පාඨකයාට ලැබේ.

ඩිමයි 1/8 පොතකි. පිටු 110 ක් ඇතුළත් ය. මිළ රු. 35.00 කි.

විමසිම් හා ලිපි:–

සභාපති,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තැ. පෙ. 1764,
නිදහස් මාවත,
කොළඹ 07.

මුදල්/තැපැල් ඇණවුම් හෝ චෙක්පත්–සභාපති, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය නමට ලියනු මැනවි.

බීසා පුහුණු වැඩසටහන – ඕස්ට්‍රේලියාව

(BISA–Bibliographic and Information Services in Asia and Pacific).

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලයේ පුස්තකාල විද්‍යා අංශය මගින් ආසියා හා පැසිෆික් රටවල පුස්තකාල ක්ෂේත්‍රයේ නියුතු වූවන් සඳහා පහත දැක්වෙන කෙටිකාලීන පුහුණු පාඨමාලා 1992 වර්ෂය සඳහා පැවැත්වීමට නියමිතව ඇත.

1. පරිගණක ආශ්‍රිත සුචිකරණ **(Computer Based Cataloguing)**
2. පුස්තකාල කළමනාකරණය **(Library Management)**
3. CDS / ISIS පරිගණක පද්ධතිය CDS / ISIS Software Training).

පුස්තකාල කටයුතු පිළිබඳ විදේශීය රටක පුහුණුවක් ලබා ගැනීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් පහත ලිපිනයට ලියා විමසන්න.

Maureen Henninger,
School of Librarianship,
University of New South Wales,
P.O. Box 1,
Kensington N.S.W. 2033,
Australia.

1. සමරු පිහාන
2. සමරු කලාපය
3. සමරු ග්‍රන්ථය
4. ජාතික පුස්තකාල ධජය හා ලාංඡනය

❶



❷



❸



❹

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා නිල ලාංඡනයක් තෝරාගැනීමට දිප ව්‍යාප්ත තරඟයක් පවත්වන ලදී. එම තරඟයෙන් ප්‍රථම ස්ථානය දිනාගන්නා ලද්දේ චිත්‍ර ශිල්පී **රසල් ගෝමස්** මහතා නිර්මාණය කරන ලද ඉහත දැක්වෙන ලාංඡනයයි.

රටකට ඇත්තේ
එක ජාතික කොඩියකි

රටකට ඇත්තේ එක ජාතික පුස්තකාලයකි

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය

1990.04.27

සමෘද්ධිමත් අනාගතයකට
යහපත් පුස්තකාල සේවාවක්

නිර්මාණය: ඒ. එම්. ඩී. උපාලි

වාර්ෂික දායක මුදල රු. 30/-

මිල රු. 15/-

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් පාතළුව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ මුද්‍රණය කරවන ලදි.

National Digitization Project

National Science Foundation

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board: Colombo 07
2. Date Scanned : 2017/10/10
3. Name of Digitizing Company : Sanje (Private) Ltd. No 435/16. Kottawa Rd. Hokandara North. Arangala. Hokandara
4. Scanning Officer

Name : N.D.R. Gamage

Signature :

Certification of Scanning

I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : Iromi

Date : 2017/10/10

"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"